# නර්තන කලාවට දායක වූ ශිල්පීන්.

## 01. ඇස් පණිභාරත.

1920 පෙබ: 24 දින කෑගල්ල දිස්ත්‍රික්කයේ අල්ගම මැදගම නම් ප්‍රදේශයේ පාරම්පරික ගුරු කුලයක උපත ලද පණිභාරත මහතා ඇති දක්ෂ උඩරට නර්තන ශිල්පියෙකි.දේශීය උඩරට නර්තන ශිල්පය මෙන්ම අනෙකුත් දේශීය නර්තන සම්ප්‍රධායන්ද, ඉන්දියානු නර්තන සම්ප්‍රධායන්ද, එතුමා මැනවින් ප්‍රගුණ කළ අයෙකි.දක්ෂ මුද්‍රා නාට්‍ය ශිපියෙකු ද වූ මෙතුමා නිර්මාණය කල මුද්‍රා නාට්‍ය අතර,

- ග්‍රහ අපලය
- ගම්මානේ මල් පිපිලා
- සත් පත්තිනි

වැදගත් වේ. එසේම ගොයම් නැටුම, පන් නෙලීමේ නැටුම යන ගැමි නැටුම් ප්‍රසාංගික වේදිකාවට ගෙන ඒමට කටයුතු කරන ලද්දේ ද මෙතුමා විසිනි.

## 02. ප්‍රේමකුමාර එපිටවෙල

1917 රත්නපුර එපිටවෙල නම් වූ ගමෙහි උපන් ප්‍රේමකුමාර එපිටවෙල මහතා කුඩා කල සිටම නර්තන කලාව කෙරෙහි වැඩි කැමැත්තක් දැක්වූ අයෙකි.දක්ෂ මුද්‍රා නාට්‍ය ශිල්පියෙකු ද වූ මෙතුමා 1950 ඉඟිනළු කලාවට අභිමානයක් එක කල අයෙකි.

- සැළලිහිණිය
- තිත්ත බත
- සකුන්තලා
- දියසේන
- සාරභූමි
- නව යුගය

එතුමා විසින් නිර්මාණය කළ ඉඟිනළු අතර වේ.

## 03. රද්දැල්ලගේ පොඩි මහත්තයා

සබරගමු නර්තන සම්ප්‍රදාය ව්‍යාප්ත කරමින් එකී සම්ප්‍රදාය ප්‍රාසංගික වේදිකාව තුල ජනප්‍රිය කරවීමෙහි ලා පුරෝගාමි වූවෙකු ලෙස රද්දැල්ලගේ පොඩි මහත්තයා හැඳින්විය හැකිය. තම පියාගෙන් සබරගමු නර්තනය ප්‍රගුණ කල පොඩි මහත්තයා ශාන්තිකර්ම භූමියේ කැපී පෙනෙන චරිතයක් විය.

සබරගමු නර්තනය එතරම් ජනප්‍රිය නොවූ අවධියක එකී නර්තනය වේදිකාව මතට ගෙන ඒමට පුරෝගාමී වූ සම්පත් දායකයෙකු ලෙස මෙතුමා හැඳින්විය හැකිය. මොහුගේ පරම්පරාව පරංගියාවත්ත පරපුර වන අතර ගම්මඩු, පහන් මඩු, කුමාර සමයම, ගොපලු සමයම, සහ අනෙකුත් යක් තොයිල්හි කොෂ්ඨාගාරයක් බඳු වූ පරපුරකි.

සෞන්දර්ය ආයතනයේ කථිකාචාර්ය වරයෙකු ලෙස ද සේවය කළ මෙතුමා සබරගමු විෂය නිර්දේශය සකස් කිරීම, නර්තනයේ ගොරහැඩි චලන මටසිලිටු කිරීමට, අනුචිත අංග ඉවත් කොට සුදුසු අංග එක් කිරීමටත් වෙහෙසුනේය. ඒ සඳහා තම කාලයත් ශ්‍රමයත් වය කළ පුරෝගාමියෙකු ලෙස මෙතුමා හැඳින්විය හැකිය.

අන්තර්ගතය - පුෂ්පා තලමුල්ලගේ මිය - ර/ඇඹිලිපිටිය ම.වි
සැකසුම - Y.M.S.S.බාලසූරිය මෙනවිය -රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය.

**04.** <u>මීගම කේ. එස්. ප්‍රනාන්දු මහතා</u>

පහතරට නර්තන කලාවේ කීර්ති නාමයක් දිනා සිටි මීගම සරනේලිස් ප්‍රනාන්දු ගුරුතුමාගේ වැඩිමහල් පුත්‍රයා වූ කරුණාච්චාරී සුදෙරිස් ප්‍රනාන්දු මහතා 1920 පෙබරවාරි 20 වන දින මෙලොව එළිය දුටුවේය. කවි,ශ්ලෝක සන්න, අෂ්ටක, ආදිය කට පාඩමින් කීමේ අපූර්ව දක්ෂතාවක් හිමි කේ. එස් ප්‍රනාන්දු මහතා ඉගෙනීමෙහි අති දක්ෂයෙකු විය. වයස අවුරුදු 13 වන විට බෙන්තර සුද්දගොඩ "අමරස " ගුරුතුමාගෙන්ද පාරම්පරික බෙන්තර රංග ශෛලිය හැදෑරූ මෙතුමා පහතරට නර්තන සම්ප්‍රදායේ සාම්ප්‍රදායික නර්තන අංග ගණනාවක් ප්‍රාසංගික වේදිකාවට ගෙන ආ පුරෝගාමියෙකි.

- ගිරිදේවී
- රත්රාග වන්නම
- සුරඹාවල්ලිය
- නාරිලතා කෝලම

වැනි නර්තනාංග ඒ අතරින් කීපයකි.නූතන වේදිකාවෙහි ද අතිශය ජනප්‍රිය නර්තනාංගයක් වන "සළුපාලිය" වේදිකාවට ප්‍රසංගයක් වශයෙන් නිර්මාණය කරන ලද්දේ ද කේ.එස්.ප්‍රනාන්දු මහතා විසිනි.

e-තක්සලාව The National e-learning Portal for The General Education

අන්තර්ගතය - පුෂ්පා තලමුල්ලගේ මිය - ර/ඇඹිලිපිටිය ම.වි
සැකසුම - Y.M.S.S.බාලසූරිය මෙනවිය -රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය.